Department of Education, Sabaragamuwa Province/ Weekly School

## පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

## සති පාසල

**විෂය- පෙරදිග සංගීතය**

**සතිය-1**

**ශ්‍රේණිය - 9**

සැකසුම - ඩබ්.එන්.ජී.චන්ද්‍රකාන්ති

රෙ/ නිවි/ ඇලපාත මහා විද්‍යාලය

**නිපුණතාව 6.0** - රංග සම්ප්‍රදායයන්හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 6.1** - නූර්ති ගී ගායනයේ කුසලතා ලබයි.

**ක්‍රියාකාරකම 6.1.1 - නූර්ති ගීතයක් ගායනය**

**ඉහත 6.1.1 ක්‍රියාකාරකමට අදාළ ව සපයා ඇති අංක 01, 02, 03 පැවරුම් සම්පූර්ණ කරන්න.**

පැවරුම- 01

1. නිර්දේශිත දුක්කොත් පද්මාවතී යන ගීතය පහත සබැඳිය ආධාරයෙන් ශ්‍රවණය කරන්න.

https://youtu.be/jRTtvJOGG_o

11. එම ගීතයෙහි පදමාලාව නිවැරදි ව ඔබේ අභ්‍යාස පොතේ සටහන් කරගන්න.

111. නාදමාලාව තහවුරු වන තෙක් ඉතා හොඳින් මෙම ගීතය ගායනයට හුරුවන්න.

පැවරුම- 02 (ලිඛිත)

❖ **නූර්ති නාට්‍ය ශෛලිය පිළිබඳ ඔබ පළමු වාරයේ උගත් න්‍යායාත්මක දැනුම භාවිත කර පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1. නූර්ති ආරම්භය පිළිබඳ කෙටි සටහනක් ලියන්න.
2. නූර්ති නාටක සඳහා පදනම් වී ඇති සංගීත සම්ප්‍රදාය කුමක්ද?
3. නූර්ති නාට්‍ය කලාවේ පුරෝගාමීන් ලෙස කටයුතු කළ නිෂ්පාදකයන් දෙදෙනා කවුද?
4. ප්‍රචලිත නූර්ති නාටක 5ක් නම් කරන්න.
5. නූර්ති සඳහා යොදාගන්නා ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය කුමක්ද?

පැවරුම - 03

1. විද්‍යුත් මාධ්‍යයන්හි ප්‍රචාරය වන නූර්ති ගීත එක් රැස් කර පොත් පිංචක් නිර්මාණය කරන්න.